**ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ**

**දෙපාර්තමේන්තුව හා ක්‍රීඩා සංගම් පිළිබද විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව.

**I – කොටස**

**ක්‍රීඩා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ සම්පිණ්ඩන වාර්තාව**

---

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.2,850,500,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.2,183,250,470 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ගෙන් ශුද්ධ ඉතිරිවීම් පිළිවෙලින් රු.276,290,730 ක් හා රු.390,958,800 ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31 ක් හා සියයට 20 ක්ව පැවතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට<br>ශුද්ධ ප්‍රතිපාදනය<br>රු. | උපයෝජනය<br>රු. | ඉතිරිය<br>රු. | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 136 | 895,273,000 | 618,982,270 | 276,290,730 | 31 |
| 219 | 1,955,227,000 | 1,564,268,200 | 390,958,800 | 20 |
| **එකතුව** | **2,850,500,000** | **2,183,250,470** | **667,249,530** | **23** |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තත්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තත්‍ය | අවම සීමාව | තත්‍ය | උපරිම සීමාව | තත්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 13601 | 6,000,000 | 5,091,121 | 2,800,000 | 3,716,575 | 24,000,000 | 12,677,245 |
| 21901 | 8,000,000 | 7,838,703 | 4,000,000 | 7,008,815 | 33,000,000 | 25,679,727 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් ශේෂයන්හි එකතුව රු.222,219,628 ක් විය. විස්තර පහත දැක්වේ.

| | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|
| | | | රු. |
| (i) | ක්‍රීඩා අමාත්‍යාංශය | 6000/0000/00/0015/0048/000 | 22,145,192 |
| (ii) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0100/000 | 200,074,436 |
| | **එකතුව** | | **222,219,628** |

**<u>2- කොටස</u>**

**එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව**

**-------------------------------------------------**

## 1. ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශය

----------------------------------

### 1.1 විගණන විෂය පථය

---------------------

ක්‍රීඩා අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජනවාරි 13 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ සහ අදහස් දැක්වීම්, විගණනය සඳහා ඉදිරිපත්කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

-----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ක්‍රීඩා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් වෙනත් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

----------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනය | 2002 නොවැම්බර් 18 දිනැති අංක අයිඒඅයි/2002/ 02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

### (ආ) පොදු තැන්පත් ගිණුම

-----------------------

මුදල් රෙගුලාසි 565(4) ප්‍රකාරව පොදු තැන්පත් ලෙජරය එක් එක් වර්ෂය සඳහා අළුතින් විවෘත කර එක් එක් ගිණුම් ශේෂය සැඳුම් ගන්නා එක් එක් විෂය වෙන වෙනම අලුත් ලෙජරයට ගෙනයායුතු වුවත් එසේ සිදුකර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාරව එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කළයුතු මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

### 1.4.1 බේරුම් නොකළ බැරකම්

---------------------------

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් පිළිබඳව කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබූ අතර වැය විෂයයන් 12 කට අදාළව ප්‍රතිපාදන ඉක්මවා රු.1,557,694 ක බැරකම් සඳහා බැඳීම් ඇතිකරගෙන තිබුණි.

## 1.5 කාර්යසාධනය

---------------

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව / ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රගතිය පිළිබඳව නිරීක්ෂණ පහත දැක්වේ.

### 1.5.1 ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රීඩාපිටි පහසුකම් තිබියදි, 2013 වර්ෂයේදී ප්‍රායෝගික පුහුණු සඳහා බාහිර ආයතන වලින් කුලියට ගෙන තිබූ ක්‍රීඩාපිටි සඳහා රු.109,750 ක කුලී ගෙවා තිබුණි.

(ආ) ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් පවත්වනු ලබන එක් එක් පාඨමාලා වෙනුවෙන් වූ විභාග ප්‍රශ්නපත්‍ර සැකසීම සහ පිළිතුරුපත් ඇගයීම් ඒ ඒ විෂයයන්ට අදාල දේශකවරු කණ්ඩායමක් විසින්ම සිදුකිරීම ස්වාධීනත්වයට හානිකර බව නිරීක්ෂණය විය.

(ඇ) 2013 වර්ෂයේ පැවැත්වීම සඳහා සැලසුම් කරන ලද පාඨමාලා සහ පවත්වන ලද පාඨමාලා පිළිබඳ පරීක්ෂා කිරීමේදී සැලසුම් කරන ලද නමුත්, ක්‍රීඩා කළමනාකරණ පාඨමාලාව හා පුහුණුකරුවන් සඳහා පිහිණුම් උසස් පාඨමාලාව පවත්වා නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) පරිපාලන අංශය, කායික ව්‍යායාම් අංශය, පාඨමාලා අංශය සහ පුහුණුකරුවන් ලියාපදිංචි කිරීමේ අංශයට ඉන්වෙන්ට්‍රි පොත් වෙන් වෙන්ව පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ප්‍රධාන ඉන්වෙන්ට්‍රියේ අඩංගු ඉහත අංශවල වත්කම් පිළිබඳ විස්තර යාවත්කාලීන කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඉ) ක්‍රීඩා පාසලේ පැවති තනතුරු පුරප්පාඩු 05 ක් සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.6 අවිධිමත් ගනුදෙනු

ක්‍රීඩා වෛද්‍ය ආයතනය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1.1 (අ) ඡේදය අනුව තාක්ෂණික පිරිවිතර නොමැතිව, ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නම්කර තිබූ සැපයුම්කරුවන් 06 දෙනෙකුගෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පරිපාටියෙන් බැහැරව ක්‍රීඩා අමාත්‍යාංශය විසින් Medical Treadmill යන්ත්‍රයක් සහ Cardio Coach Vo2 Quick Start Kit යන්ත්‍රයක්, සීමිත මිල ගණන් කැඳවා රු.3,850,000 කට පුද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණි.

## 1.7 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 21 | **03** |
| (ii) | තෘතියික මට්ටම | 12 | 08 | 04 |
| (iii) | ද්විතීයික මට්ටම | 90 | 67 | 23 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 74 | 63 | 11 |
| | **එකතුව** | **200** | **159** | **41** |

**(ආ) ක්‍රීඩා වෛද්‍ය ආයතනයට සම්බාහක III ශ්‍රේණියේ නිලධාරීන් බඳවා ගැනීම.**

2012 නොවැම්බර් 23 දින සම්බාහක III ශ්‍රේණියට නිලධාරින් 6 ක් බඳවාගෙන තිබුණු අතර ඒ පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ බඳවා ගැනීමේ පරිපාටියේ 7.2.4.2 ඡේදයට අනුව වෘත්තීය පරීක්ෂණයේ සමත් ලකුණු මට්ටම සියයට 50 ක් විය යුතු වුවද, පාඨමාලා අධ්‍යක්ෂක විසින් අදාල ලකුණු මට්ටම සියයට 35 දක්වා නිසි අනුමැතියකින් තොරව අඩුකර බඳවාගැනීම් සිදුකර තිබුණි. තවද පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු වුවත් එසේ කැඳවා නොතිබුණු අතර

බඳවාගැනීම් පරිපාටියට අනුව වෘත්තිය සුදුසුකම් නොමැති අයදුම්කරුවන් පස් දෙනෙකු අදාළ තනතුරු වලට බඳවාගෙන තිබුණි .

(ii) බඳවාගැනීම් පරිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සමත් ලකුණු ප්‍රමාණයන් නිශ්චිත වශයෙන් දක්වා නොතිබුණු අතර නිලධාරීන්ගේ සුදුසුකම් දැක්වෙන සහතික පත්‍රයන්හි ඡායා පිටපත් මුල් පිටපත් සමඟ සසඳා සත්‍ය පිටපත් බවට වගකිවයුතු නිලධාරියකු විසින් සහතික කර නොතිබුණි. එසේම බඳවාගෙන තිබු ඇතැම් නිලධාරින්, වෘත්තීය පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු ප්‍රමාණයන් සනාථ කිරීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) බඳවා ගැනීමේ පරිපාටියේ 7.2.2.2 වගන්තියට අනුව අයදුම්පත් ඉදිරිපත් කරන දිනට අදාළ වෘත්තීය සුදුසුකම් ලබාගෙන තිබිය යුතු වුවත් නිලධාරීන් දෙදෙනකුගේ වෘත්තීය සහතික පරික්ෂා කිරීමේදී ඒවා 2009 අප්‍රේල් 07 නිකුත් කර තිබුණද ඒ වන විට වෘත්තීය ආයතනය, පිළිගත් වෘත්තිය ආයතනයක් ලෙස ජාතික ආධුනික පුහුණු කිරීම් අධිකාරියේ (NVQ) ලියාපදිංචි වී නොතිබු බව නිරීක්ෂණය විය.

(iv) අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද නොමැති 04 දෙනෙකු තෝරාගෙන තිබූ අතර ඔවුන්ට පළපුරුද්ද සඳහා ලකුණු 03 බැගින් ලබාදී තිබුණි. තවද සම්මුඛ පරීක්ෂණයේදී ක්‍රීඩා කුසලතාවය ඇති අයදුම්කරුවන් සඳහා ලකුණු ලබාදිය යුතුව තිබුණද, ක්‍රීඩා කුසලතා සම්බන්ධයෙන් තහවුරු කිරීමට සහතික ඉදිරිපත්කර නොතිබූ අයදුම්කරුවන් තිදෙනෙකු සඳහා ලකුණු ලබාදී තිබුණි.

(v) 2011 සැප්තැම්බර් 01 දින අනියම් පත්වීම් ලද නිලධාරීන් විසින් වෘත්තීය සුදුසුකම සනාථ කිරීම සඳහා 2011 නොවැම්බර් 01 දින ඉදිරිපත් කර තිබූ, ක්‍රීඩා වෛද්‍ය ආයතනයෙන් නිකුත් කළ සහතික පරීක්ෂා කිරීමේදී අදාළ නිලධාරීන් පත්වීම ලබාගන්නා දින වන විට වෘත්තීය සුදුසුකම් සපුරා නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 2. ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන

වාර්තාව 2014 නොවැම්බර් 13 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වෙලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම.**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයක් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**2.3 විගණන නිරීක්ෂණය**

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (එ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 2.4 සිට 2.10 දක්වා වූ ඡේදවල සඳහන් වෙනත් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

---

සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුම් දෙමළ පිටපත 2014 දෙසැම්බර් 31 දිනටද විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

---

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|
| (i) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනය | 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ඈ) අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයය 219-1-1-1102 සඳහා වෙන් කරන ලද රු.2,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.300,000 ක් වෙනත් වැය විෂයයකට මාරුකර තිබුණු අතර ඉතිරි රු.1,700,000 ක ප්‍රතිපාදන උපයෝජනයට නොගෙන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 23 ක් සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන්, උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ත් සියයට 99 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) ජංගම නොවන වත්කම් සංචලන වාර්තාව**

**---------------------------------------------**

2012 දෙසැම්බර් 31 දිනට වැය විෂයය 2012 හි අවසන් ශේෂය රු.2,520,956 ක් වූ අතර 2013 ජනවාරි 01 දිනට එම ශේෂය රු. 2,464,929 ක් ලෙස රු.56,027 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඉ) බේරුම් නොකල බැරකම්**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට රු.96,524,009 ක් වූ බේරුම් නොකළ බැරකම් පිළිබඳව කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබූ අතර වැය

විෂයයන් 11 කට අදාළව ඉතිරිය ඉක්ම වූ රු.181,372,838 ක බැරකම් සඳහා බැදීම් ඇතිකරගෙන තිබුණි.

(ii) විසර්ජන ගිණුමේ ඕ.ජී.එස්.ඒ. 8 යටතේ බැරකම් වශයෙන් එකතුව රු.384,308,793 ක් දක්වා තිබුණද, ගිණුම සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛනය අනුව බැරකම් රු.384,705,264 විය. ඒ අනුව ඕ.ජී.එස්.ඒ. 8 යටතේ දක්වා තිබූ බැරකම් හා ගිණුම සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛනය අනුව බැරකම් අතර රු.396,471 ක වෙනසක් විය.

**(ඊ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ස්ථාන මාරු වීම් ලැබ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට පැමිණි නිලධාරින් 4 දෙනෙකුට අයත් එකතුව රු.180,990 ක් වූ ණය ශේෂ ගෙවා නිරවුල් නොකර සී.සී.10 ලේඛනයට ඇතුලත් කර තිබුණි. තවද නොවැම්බර් මස සිට අයකර තිබූ ණය වාරික අදාල ආයතනයට ප්‍රේෂණය නොකර මාසික ගිණුම් සාරාංශ මඟින් ආදායමට බැර කර තිබුණි.

(ii) දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් පාලන ගිණුමේ වර්ෂ අවසාන ශේෂය රු.25,679,727 ක් වූ අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව ශේෂය රු. 25,650,702 ක් වුවද රු. 29,025 ක වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි.

(iii) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව ණය හා අත්තිකාරම් ශේෂ දැක්වෙන කේවල ගිණුම් ශේෂ ලේඛනය කාර්තුමය වශයෙන් තුලනය කර පිළියෙල කර නොතිබුණු අතර 2013 අප්‍රේල් මස සිට සේවයට වාර්තා කර නොමැති විදුලි කාර්මිකයෙකුගෙන් අය විය යුතු රු.40,100 ක ණය ශේෂය අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(iv) 2013 දෙසැම්බර් 31 දිනට, කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ශේෂය රු.12,501,746 ක් වූ අතර පාලන ගිණුම අනුව ශේෂය රු.25,679,727 ක් විය. ඒ අනුව ශේෂ අතර වූ රු.745,234 ක වෙනස නිවැරදි කිරීමට කටයුතු නොකර, කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ශේෂයද රු.25,679,727 ක් ලෙස දක්වමින් සැසඳුම් ප්‍රකාශය ඉදිරිපත් කර තිබුණි.

(v) භාෂා පරිවර්තකයෙකු වශයෙන් සේවය කල නිලධාරියෙකු, විදේශ ගත වීම සඳහා 2012 මාර්තු 23 දින සිට වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබුණු අතර ඇයගේ හිඟ මුදල කාලත්‍රයාගේ වැටුපෙන් අයකර වාරික වශයෙන් එවීමට විදේශ කටයුතු අමාත්‍යාංශය එකඟ වී තිබුණි. ඒ අනුව 2013 ඔක්තෝබර් මාසයේදී 2012 මාර්තු සිට 2013 අගෝස්තු කාලය සඳහා රු.36,282 ක් මාසික ගිණුම් සාරාංශ මඟින් පියවා තිබුණද එය ගිණුම් වලට ගෙන නොතිබුණි.

**(උ) අග්‍රිම ගිණුම්**

------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව, 2013 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකල අග්‍රිම ශේෂය රු.1,754,058 ක් වූ අතර, විසර්ජන ගිණුම අනුව ශේෂය රු.634,808 ක් විය. ඒ අනුව ශේෂයන් අතර වූ රු.1,119,250 ක වෙනස, නොපිය වූ අත්තිකාරම් ලෙස රු. 643,591 ක් සහ ගිණුම් සාරාංශ සැකසීමේ දෝෂ රු.475,659 ක් ලෙස දක්වා තිබුණි.

(ii) මුදල් පොත අනුව, 2013 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට පිය විය යුතු අග්‍රිමය ශේෂය රු.22,433 ක් වූ අතර විසර්ජන ගිණුම අනුව ශේෂය රු.634,808 ක් විය. ඒ අනුව විසර්ජන ගිණුමේ ශේෂය රු.612,375 ක් වැඩියෙන් පෙන්වා තිබුණි.

**(ඌ) පොදු තැන්පත් ගිණුම**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වසර දෙකකට වඩා වැඩි රු.88,440,221 ක් වූ පොදු තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ලෙජරය, මාසික ගිණුම් සාරාංශය සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර ශේෂයන්හි පහත වෙනස්කම් විය.

| විස්තරය | හර කිරීම් | බැර කිරීම් | අවසාන ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| තැන්පත් ලෙජරය අනුව ශේෂය | 38,778,934 | 112,643,828 | 199,832,425 |
| මාසික ගිණුම් සාරාංශය අනුව ශේෂය | 38,613,258 | 112,722,195 | 199,680,024 |
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව ශේෂය | 38,613,259 | 112,720,164 | 200,074,436 |

(iii) 2013 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ලෙජරය අනුව විසර්ජන ගිණුම තුලින් අනාවරණය කර තිබුණු ශේෂය රු.199,832,425 ක් වුවද, කේවල ශේෂ ලැයිස්තුව අනුව 2014 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ගොස් තිබුණු ශේෂය රු.200,145,505 ක් විය. ඒ අනුව අදාළ ශේෂ අතර රු.242,011 ක වෙනසක් විය.

**(ඵ) විගණනය සඳහා වවුචර ඉදිරිපත් නොකිරීම**

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂාවේදී එකතුව රු.9,473,691 ක් වූ වවුචර 55 ක් විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

**2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**---------------------------------------**

**2.4.1 අභ්‍යන්තර විගණනය**

-----------------------

දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන ඒකකයෙන්ද ප්‍රමාණවත් විගණනයක් සිදුකර නොතිබුණි.

**2.5 වත්කම් කළමනාකරණය**

---------------------------

**2.5.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-----------------------------------------**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/ 01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා

විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.6 අනුකූල නොවීම්

### (අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරික්ෂණවලදී අනාවරණය වූ නීති, රීති හා රෙගුලාසි හා විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (i) | <u>ව්‍යවස්ථාපිත විධිවිධාන</u><br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය. | |
| | XII වැනි පරිච්ඡේදයේ 14 වන වගන්තිය | දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පෞද්ගලිකව අයදුම්කරන ලද එහෙත් ඔහුගේ සිය තනතුරට අදාල බදවාගැනීමේ හෝ උසස් කිරීමේ පරිපාටිය යටතේ දක්වා නොමැති හා ඔහුගේ උසස්වීම් වලටද අදාල නොමැති ක්‍රීඩා පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම වෙනුවෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ක්‍රීඩා අධ්‍යක්ෂ වෙත වැටුප් සහිත නිවාඩු අනුමත කර වැටුප්, අනියම් දීමනා හා උණුසුම් ඇඳුම් දීමනා ලෙස පිළිවෙලින් රු.416,158 ක්, රු.120,375 ක් සහ රු.16,578 ක් ගෙවා තිබුණි. තවද අධ්‍යන කාල පරිච්ඡේදය අතරතුර ඔහුට ලංකාවට පැමිණීම සඳහා සහ ආපසු යෑම සඳහා ගුවන් ටිකට්පත් වෙනුවෙන් රු.130,000 ක්ද ගෙවා තිබුණි. |
| | (xv)11.1 ඡේදය | සියලු නිලධාරීන් ගුවන් ගමන් වලදී පිරිමැසුම් පංතියේ ගමන් කල යුතු වුවත් අධ්‍යක්ෂක ජනරාල්ගේ, 2013 ජුලි 06 දින සිට දින 03 ක බෑනායි සංචාරයේ ව්‍යාපාරික පංතියේ |

ගමන් කර තිබූ අතර ඒ සඳහා ගුවන් ගමන් ගාස්තු ලෙස රු. 82,000 ක් වැය කර තිබුණි.

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි
-----------------------------------

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 110 | විධිමත්ව පිළියෙල කරන ලද හානි පිළිබඳ ලේඛනයක් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 214 | බැරකම් ලේඛනය පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 341 | උපපත්‍රිකා පොත් ලැබීම් හා ඒ පිළිබඳ ක්‍රියාකාරකම් සටහන් කිරීම සඳහා ලේඛණයක් පවත්වා ගත යුතු වුවත් එවැනි ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| මුදල්රෙගුලාසි 371(2)(ආ) | මුදල් රෙගුලාසිවලට පටහැනිව නිලධාරින් 08 දෙනෙකුට අවස්ථා 10 කදී රු.30,000 සිට රු.200,000 දක්වා රු.886,580 ක අත්තිකාරම් මුදල් ලබාදී තිබුණි. |
| මුදල්රෙගුලාසි 372 | අග්‍රිම සහ උප අග්‍රිම සෑම මාසයක් අවසානයේදීම සැසඳීම කළයුතු වුවද එසේ සිදුකර නොතිබුණි. |
| මුදල්රෙගුලාසි 395(ඇ) | මාසික බැංකු සැසඳුම් වාර්තා ඊළග මාසයේ 15 දිනට පෙර පිළියෙල කළ යුතු වුවත් 2013 අප්‍රේල් මාසයෙන් පසු බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 445 | දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන වැය ලෙජරය යාවත්කාලීන කළයුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එසේ සිදුකර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 565(3) | සෑම මාසයක් අවසානයේදීම පොදු තැන්පත් ගිණුම භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සැසඳිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එසේ කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 1645 | වාහන භාර නිලධාරි විසින් තමා භාරයේ ඇති එක් එක් |

| | | |
|---|---|---|
| | | වාහනය වෙනුවෙන් 267 වැනි පොදු ආකෘති පත්‍රය ප්‍රකාර වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වාගත යුතු වුවද, දෙපාර්තමේන්තු වාහන 09 කට අදාල ලොග් සටහන් සම්පූර්ණ කර නොතිබුණු බව කරන ලද නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. |
| | මුදල් රෙගුලාසි1646 | වාහන භාර නිලධාරී විසින් අදාළ මාසයේ ධාවන සටහන් ඊලග මාසයේ 15 දිනට පෙර 268 (අ) වැනි පොදු ආකෘති පත්‍රයෙහි ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර 268 (අ) ආකෘතිය කිසිම වාහනයක් සම්බන්ධයෙන් සම්පූර්ණ කර නොතිබුණි. |
| | මුදල් රෙගුලාසි1647(ආ) | වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් පැවැත්විය යුතු අතර, එක් නිලධාරියෙකුගෙන් තවත් නිලධාරියෙකුට වාහනයේ ආරක්ෂාව භාරදෙනු ලැබූ විටක හෝ රියදුරන් පිළිබඳ වෙනසක් සිදු වූ විට සමීක්ෂණයක් සිදුවිය යුතු වුවත් එවැනි අවස්ථා වලදී භාණ්ඩ සමීක්ෂණයක් සිදු වී ඇති බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. |
| (iii) | 2007 සැප්තැම්බර් 11 දිනැති අංක 21/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාණ්ඩලික නිලධාරියෙකු රටින් බැහැරවීමේදී, අග්‍රාමාත්‍ය ලේකම්වරයාගෙන් අනුමැතිය ලබාගත යුතු වුවත්, ක්‍රීඩා පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ක්‍රීඩා අධ්‍යක්ෂක අනුමැතිය ලබාගැනීමෙන් තොරව විදේශ ගත වී තිබුණි. |
| (iv) | 2008 අප්‍රේල් 28 දිනැති අංක 431 දරන මුදල් චක්‍රලේඛය | විදේශ ගමන් සඳහා යානාපත් මිලදී ගැනීම සෑම විටම රජයේ අනුමත ආයතන වෙතින් සිදුකල යුතු වුවද ඊට පටහැනිව රු.8,071,795 ක් වටිනා යානාපත් පුද්ගලික සමාගමක් වෙතින් මිලදී ගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| (v) | 2010 ඔක්තෝබර් 11 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/ 2010/ 01 හි 3 (iii) ඡේදය | දැනුම කුසලතා වර්ධනය කරගැනීම සඳහා වන අධ්‍යයන හෝ පුහුණු වැඩසටහන් සඳහා විදේශගත වන විට අනියම් දීමනා ලෙස දිනකට ගෙවිය යුතු මුදල ඇමරිකන් ඩොලර් 30 ක් වුවද ඊට පටහැනිව අවස්ථා තුනකදී දිනකට ඩොලර් 50 බැගින් ගෙවීම හේතුවෙන් වැඩිපුර ගෙවා තිබූ මුදල ඇමරිකන් ඩොලර් 880 කි. |
| (vi) | 2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 හා 8.12.3 ඡේදය. | තරගකාරී මිලගණන් කැඳවීමකින් හෝ පිරිවිතරයන්ට අනුව අදාළ භාණ්ඩ සපයා ඇති බවට තහවුරු කර ගැනීමකින් හෝ තොරව, ආධුනික බොක්සිං සංගමය විසින් ඉදිරිපත් කරන ලද පිරිවැය ඇස්තමේන්තුවක් මත බොක්සිං වේදිකා මිලදී ගැනීම වෙනුවෙන් එම සංගමය වෙත රු.4,525,360 ක මුදලක් 2013 මැයි 09 දින ගෙවා තිබුණි. |
| (vii) | 1994 ජුලි 12 දිනැති අංක 35/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.3.3 ඡේදය | 2013 දෙසැම්බර් 31 දිනට වූ බැරකම් අදාළ ආයතන වලින් සනාථ කරවා ගත යුතු වුවත්, එකතුව රු.96,524,009 ක් වූ බැරකම් සම්බන්ධයෙන් ශේෂ සනාථනයන් ලබාගෙන නොතිබුණි. |

## 2.7 අවිධිමත් ගනුදෙනු

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන, අදාල කාර්යයන් සඳහා යොදා නොගෙන නිසි අධිකාරි බලයකින් තොරව වෙනත් කාර්යයන් සඳහා යොදාගෙන තිබූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය වූ අතර එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) නිදහස් චතුරස්‍ර ක්‍රීඩාංගණයේ කෘතිම ධාවන පථය ඉදිකිරීම සඳහා වැය විෂයය 2-2-6-2104 යටතේ වෙන් කර තිබුණු රු.53,063,745 ක ප්‍රතිපාදනය, එම කාර්යය සඳහා භාවිතා නොකොට වෙනත් කාර්යයන් සඳහා යොදාගෙන තිබුණි. තවද 2009,2010,2011 සහ 2012 වර්ෂයන් හී දීද මෙම කාර්යය සඳහා ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබූ අතර එම මුදල්ද වෙනත් කාර්යයන් සඳහා භාවිතා කර තිබුණි.

(ii) නිසි අධිකාරි බලයක් නොමැතිව ලෝහ රාමුව සහිත ගොඩනැගිල්ලක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ඉදිකර තිබුණු අතර ඒ සඳහා රු.35,478,778 ක් වෙනත් වැය විෂයයන් 03 කින් මාරු කරගෙන වැයකර තිබුණි.

**(ආ) ක්‍රීඩා සංගම් සඳහා මුදල් ලබා දීම**

**-----------------------------------**

පහත සඳහන්නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු විසින් ක්‍රීඩා සංගම් සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කරවා ගැනීමේදී, ක්‍රීඩා සංගම් වෙතින් ඇස්තමේන්තු ලබාගැනීමකින් තොරව අයවැය යෝජනා ඉදිරිපත් කර ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණි.

(ii) බොහෝ අවස්ථාවලදී, ක්‍රීඩා සංගම් වලින් වැය ඇස්තමේන්තු ලබා ගැනීමෙන් තොරව, දෙපාර්තමේන්තුව විසින් ක්‍රීඩා සංගම් වෙත 2011, 2012 හා 2013 වර්ෂ වලදී රු.145,548,064 ක අරමුදල් ලබාදී තිබිණි. තවද අදාළ සංගම් විසින් ඒවා ඵලදායීව විනිවිදභාවයකින් යුතුව අදාළ කාර්යයන් සඳහා වැය කර තිබුණේද යන්න, පිළිබඳව පසු විපරම් කිරීමක් සිදුකර නොතිබුණු අතර ලබාදුන් අරමුදල් වලින් ඉතිරි වී ඇති අරමුදල් ආපසු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(iii) 2013 වර්ෂයේ 219-01-01-1508 වෙනත් වැය විෂයය යටතේ ගුවන් ටිකට්පත්, කිරිපිටි, යෝගට් සහ ආහාරපාන සඳහා වන වියදම්ද දරාතිබු අතර එම වියදම් එකී වැය විෂයය මඟින් දැරීමට ඇති අධිකාරි බලය විගණනයට ඉදිරිපත් නොකෙරුණි

**(ඇ) විදේශ ගමන් වියදම්**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 දෙසැම්බර් මස 04 දින ඉතාලියේ පැවති ක්‍රීඩා හා සිනමා රූපවාහිනී උළෙලට සහභාගී වීම වෙනුවෙන් ඇමති පුද්ගලික කාර්ය මණ්ඩලයේ මාධ්‍ය ලේකම්ට අනියම් හා සංයුක්ත දීමනා ලෙස රු. 346,255 ක් ගෙවා තිබුණද එම ගෙවීමට අදාල කිසිඳු සටහනක් දෙපාර්තමේන්තු වැය ලෙජරයේ සටහන් කර නොතිබුණි. ඒසේම අදාල ගෙවීම 2001 අප්‍රේල් 04 දිනැති අයවැය චක්‍රලේඛයේ 1 ඡේදයට පටහැනිව බවද නිරීක්ෂණය කෙරේ.

(ii) 2013 ඔක්තෝබර් 21 සිට නොවැම්බර් 03 දින දක්වා ඉන්දුනීසියාවේ ජාකර්තාහි පැවති CECS Level (iv) course for middle and long distance පාඨමාලාව සඳහා ගුවන් ගමන්, අහාර හා නවාතැන් වියදම් සපයන පදනම මත එක් පුහුණුකරුවෙක් සහභාගි කරවන ලෙස සංවිධායක ආයතනය දන්වා තිබියදී ඊට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් අමතර නිලධාරියෙකු සහභාගී කරවා තිබුණි. තවද ඔහුගේ ගමනට අදාළ වියදම් ව්‍යාපෘතියකින් දරන බව සඳහන් කර අනුමැතිය ලබාගෙන තිබියදී ගුවන් ගමන් හා නවාතැන් වියදම් ලෙස රු.225,632 ක් හා අනියම් දීමනා ලෙස රු.100,179 ක් දෙපාර්තමේන්තුව විදේශ ගමන් වියදම් වැය විෂයයෙන් දරා තිබුණි.

(iii) 2013 සැප්තැම්බර් 13 දින සිට නොවැම්බර් 21 දින දක්වා තායිලන්තයේ පැවති 17 වන ජ්‍යෙෂ්ඨ කාන්තා වොලිබෝල් තරඟාවලිය සඳහා සහභාගි කරවිය යුතු සංයුතියට පටහැනිව, අධ්‍යක්ෂක ජනරාල්ගේ නිර්දේශය මත නිලධාරියකු නිරීක්ෂකයෙකු ලෙස සහභාගී කර තිබුණි. වොලිබෝල් සම්මේලනය විසින් ගමනට අදාලව රු.115,500 ක වියදම් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබියදී, එය සැලකිල්ලට නොගෙන දෙපාර්තමේන්තුව විසින් රු.438,800 ක මුදලක් නිරීක්ෂකට ලබා දී තිබුණද ඉන් වැයවී තිබුණේ රු.121,575ක් පමණි. ඉතිරි රු.317,225 ක මුදල වොලිබෝල් සම්මේලනය වෙත හෝ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තෙමේන්තුව වෙත ආපසු ගෙවා නොතිබු අතර එය ලබා ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(vi) විදේශ පුහුනුවීම් සඳහා නිලධාරීන් තෝරා ගැනීම සඳහා විධිමත් පරිපාටියක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණු අතර නිලධාරීන් ක්‍රීඩා සංගම් සමග පවත්නා සම්බන්ධකම් මත විවිධ පාඨමාලා සඳහා ඔවුන් නම් කරවාගෙන තිබුණි. එම නිලධාරීන්ට දෙපාර්තමේන්තුව විසින් රාජකාරී නිවාඩු හා වියදම් සඳහා අරමුදල්ද සපයා තිබුණි.

**(ඇ) ක්‍රීඩා භාණ්ඩ මිල දී ගැනීම් සහ බෙදාහැරීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 නොවැම්බර් 29 දිනැති අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ක්‍රීසංදෙ/නිඅක්‍රි/02/14/2012 ලිපිය ප්‍රකාරව ක්‍රීඩා සමාජ 600 ක් සඳහා ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීමට මිල ගණන් කැඳවා ඇතත්, 2013 ජුලි 02 දිනැති ටෙන්ඩර් මණ්ඩල තීරණයට අනුව ක්‍රීඩා සමාජ 400 ක් සඳහා ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීමට රු.2,555,920 ක් අනුමත කර තිබුණි. ඒ අනුව අවශ්‍යතාවයන් නිසියාකාරව හඳුනාගැනීමෙන් තොරව ක්‍රීඩා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(ii) 2013 ජූලි 04 දින සපයන ලද ක්‍රීඩා භාණ්ඩ වලින් වොලිබෝල් දැල් සහ සැහැල්ලු පන්දු ක්‍රිකට් පිති තෝරාගත් සාම්පලයට අනුකූල නොවන බව නියෝජ්‍ය අධ්‍යක්ෂ ක්‍රීඩා විසින් තහවුරු කර තිබියදී, සාම්පලයට අනුකූල නොවූ ක්‍රිකට් පිති ප්‍රතික්ෂේප නොකර ගබඩාවට භාරගෙන තිබුණි. එසේම සාම්පලයට අනුකූල නොවීම මත වොලිබෝල්, ප්‍රතික්ෂේප කර තිබියදී, 2013 ජූලි 16 දින සාම්පලයට අනුකූල නොවූ වොලිබෝල් 100 ක් ලබාගෙන තිබුණි.

**(ඉ) ශක්ති වර්ධන ශාලාව සඳහා ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම**

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ක්‍රීඩා උපකරණ පෞද්ගලික ආයතනයකින් රු.1,479,000 කට මිලදී ගැනීමට නිර්දේශකර තිබුණද, අදාළ නිර්දේශය සඳහා පදනම් කරගත් ලංසු ඇගයීම් වාර්තා හා භාණ්ඩ වලට අදාල පිරිවිතරයන්ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.8 අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු

දෙපාර්තමේන්තු කායවර්ධන මධ්‍යස්ථානයේ ආදායම් ජාතික ක්‍රීඩා අරමුදලේ ගිණුමට බැර කලද ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතියක් නොවීය.

## 2.9 කළමණාකරණ දුර්වලතා

දෙපාර්තමේන්තු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා එක් බැහැරයෑමේ ලේඛනයක් පමණක් පවත්වාගෙන යන අතර කාර්යාලයෙන් බැහැර රාජකාරිවල නිරත කාර්ය මණ්ඩලයේ වැඩි පිරිසක් බැහැරයාමේ ලේඛනයේ සටහන් තැබීමක් සිදුකර නොතිබුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත සේවක සංඛ්‍යා හා තත්‍ය සේවක සංඛ්‍යා

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 09 | 05 | - |
| (ii) | තෘතියික මට්ටම | 05 | 02 | 03 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 254 | 191 | 63 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 52 | 32 | 20 | - |
| (v) | වෙනත්(අනියම් පදනම) | - | 14 | - | 14 |
| | එකතුව | 325 | 248 | 91 | 14 |

(ආ) කාර්ය මණ්ඩල සමාජිකයින් 113 දෙනකුට අදාළ නිවාඩු ලේඛණ පරික්ෂා කිරීමේදී නිලධාරින් විසින් පෙර වර්ෂ වලදී ලබා ගන්නා ලද නිවාඩු පහසුවෙන් හදුනා ගත හැකි වන පරිදි වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. තවද වාර්ෂිකව අළුත් නිවාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් තිබුණු අතර එහි පසුගිය වර්ෂවල නිවාඩු සටහන් කර නොතිබුණි.

## 3. ක්‍රීඩා සංගම්

### 3.1 ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය

#### 3.1.1 ගිණුම්කරණ අඩුපාඩු

පහතසඳහන්නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.6,073,103,419 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද එහෙත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් භාවිතා කරන ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) ආර්. ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩා පිටිය වෙනුවෙන් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට ගෙවිය යුතු රු.26,325,045 ක කුලී ගිණුම්වලට ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් ගිණුම්වල දක්වා ඇති කුලී වියදම් හා ගෙවිය යුතු කුලී එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

### 3.1.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ක්‍රීඩා සමාජයක් වෙත 2008 වසරේදී රුපියල් මිලියන 15 ක ණය මුදලක් ලබා දී තිබුණි. එකී මුලික ණයමුදලෙන් අය විය යුතු රු.5,022,704 ක් හා රු.2,358,879 ක ප්‍රමාද ගාස්තු 2014 නොවැම්බර් 26 දින වන විටත් අය නොවී තිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට පැවත එන එකතුව රු.2,825,691,664 ක් වූ වගකීම් 2014 ජූලි 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) ආසියානු ක්‍රිකට් කවුන්සිලයේ සහ විදේශ ක්‍රිකට් මණ්ඩල 05 ක ශ්‍රී ලංකා සංචාරයන් වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් වැය කර තිබුණු රු.12,761,314 ක මුදලක් අදාල ආයතන වලින් අය කරගෙන නොතිබුණි.

(ඈ) 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 189,795,545 ක් වූ ලැබිය යුතු අනුග්‍රාහක මුදලින් වසර 05 ක් ඉක්මවා තිබු රු.6,621,071 ක ශේෂයන් පැවති අතර ඒවා අයකර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අපොහොසත් වී තිබුණි.

(ඉ) බාහිර පාර්ශවයන් හතරකට වැඩිපුර ගෙවන ලදුව අයවිය යුතු රු. 5,622,417ක විනෝද බදු 2013 දෙසැම්බර් 31 දින වන විටත් ආපසු අය කරගෙන නොතිබුණි.

### 3.1.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් එකී විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කළ නොහැකි විය.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (i) | ක්‍රිකට් ආධාර | 4,999,332 | විස්තරාත්මක උපලේඛන |
| (ii) | උපදේශක සේවා ගාස්තු | 9,812,100 | උපදේශක තෝරා ගැනීමේ පදනම හා කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා අනුමැතිය |
| (iii) | නීතිඥ ගාස්තු | 7,317,858 | නීතිඥයින් තෝරා ගැනීමේ පටිපාටිය |

### 3.1.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

සමාලෝචිත වර්ෂය තුළ විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 756 මුදල් රෙගුලාසිය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 8.3.3 පරිච්ඡේදය | පාඩු ලබන ආයතන විසින් ගෙවන ප්‍රසාද දීමනා රු.1,000 ක උපරිමයකට සීමාවිය යුතු වුවත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී එක් අයකුට රු.8,250 සිට රු.500,000 දක්වා වූ ප්‍රසාද දීමනා ගෙවීමට රු.38,068,010 ක් වැයකර තිබුණි. තවද එක් අයකුට රු.2,500 සිට රු.20,000 දක්වා වූ විශේෂ දීමනා ගෙවීමට රු.1,875,000 ක්ද ගෙවා තිබුණද ඊට අදාල අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| (ඇ) | 2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | සමාලෝචිත වර්ෂයේදී රු.,780,638 ක් වටිනා සීසීටීවී කැමරා පද්ධතියක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකර මිලදී ගෙන තිබුණි. |

### 3.1.5 අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිමිකාරීත්වය නොමැති වෙලගෙදර හා මොරටුව ක්‍රිකට් ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් සඳහා පිළිවෙලින් රු.33,804,033 ක් හා රු.1,347,789 ක් වැයකර තිබූණි. මෙම පිරිවැය 2009 වර්ෂයේ සිට ගිණුම්වල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන පුහුණුකරු සමග වූ ගිවිසුම, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් අවලංගු කර තිබුණු අතර එදිනට පුහුණුකරුගේ වැටුප් සහ වෙනත් වියදම් වෙනුවෙන් පිළිවෙලින් රු.4,172,294 සහ රු.2,252,417 ක් වැයකර තිබුණි. තවද ගිවිසුම අවලංගු කිරීමෙන් පසු මාස 03 ක වැටුප් ලෙස රු.4,776,440 ක් සහ වන්දි මුදල් ලෙස රු.15,421,478 ක්ද ගෙවීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සිදු වී තිබුණි. ඒ අනුව ගිවිසුම ඒකපාර්ශිකව අවලංගු කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අතිරේකව දැරීමට සිදු වී තිබු මුදල රු.6,608,559ක්විය.

### 3.1.6 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් පෞද්ගලික විගණිත ආයතනයකට 2011 අගෝස්තු 04 දින රු.342,720 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් ස්ථාවර වත්කම් ලේඛනය 2014 නොවැම්බර් 26 දින වන විටත් යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට එරෙහිව බාහිර පාර්ශවයන් සහ බාහිර පාර්ශවයන්ට එරෙහිව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගොනු කර තිබූ නඩු වෙනුවෙන් පෙනී සිටි නීතිඥයින්ට රු.21,719,000 ක නීති ගාස්තු වැයකර තිබුණද අදාල නීතීඥයින් තෝරාගත් පදනම විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2012 පෙබරවාරි 01 දින සිට මාස 10 කාලයක් සඳහා ප්‍රධාන ආරක්ෂක නිලධාරී ලෙස පත්කර තිබූ නිලධාරියාගේ සේවා ගිවිසුම, ගිවිසුම් කාලය සම්පූර්ණ වීමට පෙර ඒකපාර්ශිකව අවසන් කිරීම හේතුවෙන් ප්‍රධාන ආරක්ෂක නිලධාරියා විසින් රු.50,000,000 වන්දි මුදලක් ඉල්ලා කම්කරු උසාවියේ නඩුවක් පවරා තිබුණු අතර එය 2014 නොවැම්බර් 26 දිනටද විසඳී නොතිබුණි.

(ඈ) 2006 වර්ෂය තුළදී තරගාවලියක් අවලංගු කිරීම හේතුවෙන් රක්ෂණ සමාගමකින් රුපියල් බිලියන 1.3 ක වන්දියක් ඉල්ලා තිබුණු අතර එම සමාගම අදාල ගෙවීම ප්‍රතික්ෂේප කිරීම නිසා ගොනු කරන ලද නඩුවක් වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දින වනවිට රු.11,369,716 ක නීතීඥ ගාස්තු දැරීමට සිදුවී තිබුණි.

(ඉ) 2012 ජුලි 15 දින සිට ආරම්භ වන පරිදි මාස 3 ½ ක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් පරිපාලනය නගා සිටුවීමට හා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යුහය නැවත සැකසීම සඳහා සහය වීමට පත්කර

තිබූ විශේෂ උපදේශකයෙකුට උපදේශක ගාස්තු සහ අනෙකුත් වියදම් ලෙස පිළිවෙලින් රු.12,925,695 ක් හා රු.2,507,462 ක් එකතුව රු.15,433,157 ක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගෙවා තිබුණි. එහෙත් උපදේශක විසින් පෙන්වා දී තිබූ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන තිබුණු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

**3.1.7** ජාත්‍යන්තර රූපවාහිනී විකාශන, ගුවන් විදුලි, අන්තර්ජාල, අනුග්‍රහක අයිතීන් සහ රූපවාහිනි නිෂ්පාදන අයිතිය (T/20, ODI සහ ටෙස්ට් තරග ගිවිසුම් 2013 – 2020 දක්වා) පිළිබඳ තාක්ෂණික සහ මූල්‍ය ඇගයීමක් කිරීමට පෞද්ගලික ආයතනයකට පවරා තිබුණද එම ආයතනය තෝරාගත් ආකාරය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

**3.1.8** 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු නොකර 2013 T-20 ලීග් ශූරතා ක්‍රිකට් තරඟාවලියේ අනුග්‍රහක කොන්ත්‍රාත්තුව රු.5,000,000 ක කොන්ත්‍රාත්ගත මුදලකට පෞද්ගලික ආයතනයකට ප්‍රදානය කර තිබුණි. එම ආයතනය සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අතර වූ එකඟතා ගිවිසුමේ 2.2.1 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්ගත මුදලින් සියයට 50 ක් ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී අයකර ගත යුතු වුවද එය සති 07 ක් ප්‍රමාද වී අයකරගෙන තිබුණි. තවද එම ගිවිසුමේ 2.2.2 ඡේදය ප්‍රකාරව ඉතිරි සියයට 50 ක මුදල තරඟාවලිය අවසන් වීමෙන් පසුව අයකර ගත යුතු වුවද එය 2013 දෙසැම්බර් 31 දින දක්වා අයකරගෙන නොතිබුණි.

**3.1.9** ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සහ නිල ඇඳුම් අනුග්‍රාහක ආයතනය අතර වූ ගිවිසුමෙහි වූ 2010 ජනවාරි 01 දින සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා වූ අනුග්‍රහක කාලය අමතර ගාස්තුවක් අය නොකර මාස 06 ක් සඳහා දීර්ඝ කර තිබුණි. තවද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් එළඹ තිබූ නව අනුග්‍රහක ගිවිසුම් කාලය 2013 ඔක්තෝබර් 01 සිට 2016 සැප්තැම්බර් 30 දින දක්වා වන හෙයින් 2013 ජනවාරි 01 සිට 2013 ඔක්තෝබර් 30 දින දක්වා වූ මාස 09 ක කාලයට අදාල අනුග්‍රහක මුදල් අයකර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අපොහොසත් වී තිබුණි.

**3.1.10 මානව සම්පත් සංවර්ධනය**

**-----------------------------**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2010 වර්ෂයේදී රු.1,460,000 ක් වැයකර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ලවා සකස් කරගන්නා ලද බඳවා ගැනීමේ කාර්ය පටිපාටි සංග්‍රහය අනුමත කරවාගෙන ඒ අනුව කටයුතු නොකර සේවකයින් බඳවාගෙන තිබුණි. තවද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සඳහා අනුමත සේවක සංඛ්‍යාවක් අදාල බඳවා ගැනීමේ කාර්ය පටිපාටියට ඇතුලත් කර නොතිබුණි.

### 3.1.11 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

---------------------------------------

පහත සඳහන්නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අභ්‍යන්තර විගණනය**

------------------------

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත නොකර විගණිත කාර්ය පෞද්ගලික විගණිත ආයතනයකට පවරා තිබුණද, 2013 වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයා වෙත කාලීනව ඉදිරිපත් නොවීය.

**(ආ) ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය ප්‍රකාරව 2013 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ඇ) අයවැය පාලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2003 ජනවාරි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය ප්‍රකාරව විධායක කමිටුව විසින් අනුමත කරන ලද අයවැය අදාල ගිණුම් වර්ෂය අවසන් වීමට දින 15 කට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත් එය පිළියෙල කර නොතිබුණි.

(ii) 2013 වර්ෂයේ අයවැය අනුව, වෘත්තීය ගාස්තු සඳහා රු.1,550,000 ක් වෙන් කලද සත්‍ය වශයෙන් දරා තිබූ වියදම රු.15,150,850 ක් විය. ඒ අනුව සත්‍ය වියදම අයවැයගත වියදමට වඩා සියයට 877 කින් වැඩිවී තිබුණි.

### 3.2 ශ්‍රී ලංකා මළල ක්‍රීඩා සංගමය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ පැවති Asian Grand Prix Series තරඟාවලියට සහභාගී වූ විදේශීය තරඟකරුවන් සඳහා ශ්‍රී ලංකා මළල ක්‍රීඩා සංගමය විසින් ගෙවා තිබූ ඇමරිකානු ඩොලර් 4,298 ක් (රු.568,797) පසුව ඔවුන්ගෙන් අයකරගෙන බැංකුගත නොකර ගුවන් ටිකට්පත් මිලදී ගැනීම සඳහා යොදාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ලියාහල අගය රු.31,674 ක් වූ ලී බඩු හා සවිකිරීම්, රු.672,270 ක් වූ කාර්යාල උපකරණ , රු.3,023,858 ක් වූ මළල ක්‍රීඩා උපකරණ හා රු.34,525 ක් වූ මුළුතැන්ගෙයි උපකරණ වලට අදාලව ස්ථාවර වත්කම් ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) 2013 වර්ෂයේදී වරළත් ගණකාධිකාරී ආයතනයක් විසින් වත්කම් භෞතික සමීක්ෂණයක් සිදුකර තිබුණද එම වාර්තාවේ නිර්දේශයන් දේපළ, පිරියත හා උපකරණ යටතේ ගැළපීම් කර නොතිබුණි.

**3.3 ශ්‍රී ලංකා අශ්වාරෝහක සංගමය**

----------------------------------

රු.257,762ක් වූ අශ්ව ආහාර මිලදී ගැනීමේ ඉන්වොයිසි නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරික්ෂණය කළ නොහැකි විය.

**3.4 <u>ගිණුම් ඉදිරිපත් කිරීම</u>**

2013 දෙසැම්බර් 31 දින වන විට සංගම් 18 ක් විසින් අවසන් ගිණුම් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.